# <u>රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් තනතුර සඳහා අයදුම්පත් කැඳවීම</u>

ඉදිරියේදී පුරප්පාඩු වීමට නියමිත රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් තනතුර සඳහා , සුදුසුකම්ලත් **<u>ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශේෂ ශ්‍රේණියේ නිලධාරීන්ගෙන්</u>** අයදුම්පත් කැඳවීමට රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කර ඇත.

- බඳවා ගැනීමේ සුදුසුකම් හා පළපුරුද්ද -

1. ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශේෂ ශ්‍රේණියේ වසර 08 කට නොඅඩු සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සහිත නිලධාරියෙක් වීම
2. සේවා කාලය තුල අවවාද කිරීම් හැර වෙනත් කිසිදු විනයානුකූල දඬුවමක් ලබා නොතිබීම
3. විශේෂ ශ්‍රේණියට උසස් වීමෙන් පසු සියලු වැටුප් වර්ධක උපයාගෙන තිබීම
4. අනුමත කාර්ය සාධන ඇගයීම් පටිපාටිය අනුව, සුදුසුකම් පරීක්ෂා කරනු ලබන දිනට පූර්වාසන්න වසර පහක් (05) තුල කාර්ය සාධන ඇගයීම් සාමාන්‍ය මට්ටමේ හෝ ඊට ඉහළ මට්ටමක පැවතීම
5. ඉංග්‍රීසි භාෂාව පිළිබඳ ප්‍රවීනතාවයක් තිබීම
   සටහන - තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලුම සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ අවසන් දිනට හෝ ඊට පෙර සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

- කායික සුදුසුකම් - සෑම අපේක්ෂකයෙකුම තනතුරේ රාජකාරි ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

- වයස - අදාළ නැත.

- තෝරා ගැනීම- අයදුම්කරුවන්ගේ සේවා පළපුරුද්ද සහ කුසලතාවය ඇගයීම සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන ලකුණු ලබා දීමේ පටිපාටියකට අනුව එම කොමිෂන් සභාව විසින් පවත්වනු ලබන යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයක් මගින් තෝරා ගනු ලැබේ.

- අයදුම්පත් ඉදිරිපත් කිරීම - අදාළ සුදුසුකම් සියල්ල ඇතුලත් කර තමන් විසින්ම සකස් කරගත් ජීව දත්ත පත්‍රිකාවක් පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් යොමු කල යුතුය. අයදුම්පත් භාර ගන්නා අවසන් දිනය 2022.12.27.

  සභාපති
  රාජ්‍ය සේවා කොමිෂන් සභාව
  1200/9, රජමල්වත්ත පාර
  බත්තරමුල්ල

- මෙම නිවේදනයේ සඳහන් උපදෙස්වලට පටහැනි ලෙස ඉදිරිපත් කරනුලබන ඉල්ලුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

- මෙම පත්කිරීම සම්බන්ධව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ගනු ලබන තීරණය අවසානාත්මක වේ.

ලේකම්
රාජ්‍ය සේවා කොමිෂන් සභාව
1200/9 රජමල්වත්ත පාර
බත්තරමුල්ල
2022.12.13